# සාමාජිකත්ව කොන්දේසි

සාමාජිකත්ව කොන්දේසි

- පුස්තකාලයට බැඳීම සඳහා ඔබගේ නම සහ වර්තමාන ලිපිනය සනාථ කරන ලියකියවිලි පෙන්වන්න. පුස්තකාලය භාරව සිටින අය තීරණය කරන ආකාරයට ලිපිනය පිළිබඳ සාක්ෂි නොමැතිව පුස්තකාලයට බැඳීම සඳහා සුදුසුකම් ලැබිය හැකිය.
- වයස අවුරුදු 16 ට අඩු අයදුම්කරුවන් සඳහා ඇපකරුවන් වශයෙන් මාපියන්/භාරකරුවන් විසින් අත්සන් කිරීම අවශ්‍යවේ. සාමාජික කාඩ්පතක් මගින් බැහැර ගනු ලබන සියළුම අයිතමයන් සහ සාමාජිකයා විසින් ගෙවිය යුතු සියළු ගාස්තු ගෙවීම සම්බන්ධයෙන් ඇපකරුවන් විසින් වගකීම භාරගත යුතුය.
- බැහැර ගැනීම හෝ ඔබගේ ගිණුමේ ඇති කිසියම් තොරතුරක් පරීක්ෂා කර බැලීම සඳහා ඔබගේ පුස්තකාල කාඩ්පත පෙන්වන්න. ඔබ ලඟ පුස්තකාල කාඩ්පත නොමැතිනම්, ඔබගේ නම සහ වර්තමාන ලිපිනය සම්බන්ධ සාක්ෂි පෙන්විය යුතුය.
- ඔබගේ නම හෝ ලිපිනය වෙනස්වුයේ නම් ඒ බව අපට දැනුම් දෙන්න.
- ඔබගේ කාඩ්පත භාවිතා කර බැහර ගනු ලබන අයිතමයක් නැතිවුවහොත් හෝ අලාභහානි සිදුවුවහොත් ප්‍රතිස්ථාපන ගාස්තුවක් ගෙවන්න. ප්‍රතිස්ථාපන ගාස්තුවෙහි අයිතමයේ වටිනාකම සහ නැවත නොගෙවන සැකසුම් ගාස්තුවක් ඇතුලත්වේ.
- ඔබගේ පුස්තකාල කාඩ්පත නැතිවුවහොත් හෝ සොරා ගනු ලැබුවහොත්, අප හට දැනුම් දෙන්න. නැතිවුණු පුස්තකාල කාඩ්පතක් නැවත ලබා ගැනීම සඳහා ඔබ විසින් ගෙවීමක් කල යුතුය.
- ඔබට තබා ගත හැක්කේ එක් පුස්තකාල කාඩ් පතක් පමණි.
- ඔබගේ පුස්තකාල කාඩ්පත භාවිතා කර බැහැර ගත් සියළුම සයිතමයන් සම්බන්ධයෙන් ඔබ වගකීම භාරගත යුතුය.
- ඔබ විසින් බැහැර ගත් අයිතමය, වෙනත් පුස්තකාල සාමාජිකයෙකු විසින් වෙන් කර නොගත් අවස්ථාවක, දෙවරක් අළුත් කල හැකිය. අළුත් කිරීම පුද්ගලිකව, දුරකථනයෙන් හෝ මාර්ගස්ථව සිදු කල හැකිය.
- ඔබට බැහැර ගැනීමට අවශ්‍ය අයිතමයක කිසියම් අලාභහානියක් දුටු විට, ඔබ විසින් බැහැර ගැනීමට පෙර ඒ බව අපට දැනුම් දෙන්න.

පුස්තකාලය තුල හැසිරීම

- අපගේ පාරිභෝගිකයන් සහ කාර්ය මණ්ඩලය හට ආරක්ෂාකාරී සහ සුවපහසු පරිසරයක් ලබාදීමට නගර සභාව ඇප කැපවී සිටියි.
- පහත හැසිරීම් පිළිගත නොහැකි බව නගර සභාව සලකයිඃ
  - හිරිහැර කිරීම, කලහකාරීබව හෝ නොමනා භාෂාව කථා කිරීම වැනි සමාජ විරෝධී හැසිරීම්.
  - හිරිහැරයක් වන ආකාරයට හැසිරීම, වෙනත් අයව අනතුරට පත් කිරීම, හෝ වෙනත් අයෙකු විසින් පුස්තකාලය භාවිතා කිරීම සම්බන්ධයන් අයහපත් ආකාරයට මැදිහත්වීම.
  - නාම පුවරුවක ඇති කරුණකට හෝ පුස්තකාලය භාරව සිටින හෝ බලයලත් නිලධාරියෙකු විසින් ලබාදෙන නීත්‍යානුකූල විධානයකට පටහැනිව කටයුතු කිරීම.
  - පුස්තකාල දේපළ විනාශ කිරීම හෝ ඒවා හට අලභහානි සිදු කිරීම ඇතුළු  පුස්තකාලයේ ඇති සම්පත් අවභාවිතා කිරීම සහ පරිගණක සහ ඉන්ටර්නෙට්/වයිෆයි භාවිතා කිරීමේ කොන්දේසිවලට අනුකූල නොවන ආකාරයට කටයුතු කිරීම.
- නොමනා ආකාරයට හැසිරෙන අය හට, අංක 3 දරණ සිටි ඔෆ් මොනෑෂ් හි පළාත් නීතියට අනුකූලව, ගොඩනැගිල්ලෙන් ඉවත්ව යන ලෙස ඉල්ලා සිටීමට පුස්තකාල කාර්ය මණ්ඩලය හට අයිතිය ඇත.
- <u>පුස්තකාලයට පැමිණෙන අමුත්තන් විසින් නගර සභාවේ, ප්‍රාන්තයේ හෝ ෆෙඩරල් රජයේ සෞඛ්‍යය අවශ්‍යතාවයන්ට සහ මාර්ගෝපදේශවලට අනුකූලව කටයුතු කිරීම අවශ්‍යවේ.</u>
- නොමනා ආකාරයට නිරන්තරයෙන් හැසිරෙන අය හට අවස්ථානුකූල කරුණු සහ නොමනා හැසිරීමේ ආකාරයට අනුව සමහර පුස්තකාල සම්පත් වෙත ප්‍රවේශවීම ප්‍රතික්ෂේප කල හැක.
- වයස අවුරුදු 11 ට අඩු දරුවන්ව වගකිව යුතු වැඩිහිටියෙකු විසින් අධීක්ෂණය කල යුතුය.
- ඉන්ටර්නෙට් භාවිතා කරන අය විසින් පරිගණක සහ ඉන්ටර්නෙට්/වයිෆයි භාවිතා කිරීම සම්බන්ධ කොන්දේසිවලට අනුව කටයුතු කල යුතුය.

පුද්ගලිකභාවය

*නගර සභාව මගින් ඔබගේ පුද්ගලික තොරතුරු භාවිතා කරන්නේ පුස්තකාල සේවා වෙත ප්‍රවේශය ලබාදීමේ අරමුණ සඳහා පමණි. ඔබගේ පුද්ගලික තොරතුරු, නීතිය මගින් අවශ්‍ය අවස්ථාවල හෝ නීතිය මගින් බලය ලබාදී ඇති අවස්ථාවල, හෝ 2014 පුද්ගලිකභාවය සහ දත්ත ආරක්ෂා කිරීමේ පනතට අනුකූලව හැර ඔබගේ අනුමැතිය නොමැතිව බාහිර පාර්ශවයන් හට ලබා දෙන්නේ නැත. නගර සභාව මගින් ඔබගේ පුද්ගලික තොරතුරු ආරක්ෂා කිරීම සඳහා ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටීන් පිළිගෙන ඇත. මේවා නගර සභා වෙබ් අඩවිය වන [www.monash.vic.gov.au/legal/privacy](http://www.monash.vic.gov.au/legal/privacy) හි ඇත.*

# පරිගණක සහ ඉන්ටර්නෙට්/වයිෆයි භාවිතය සම්බන්ධ කොන්දේසි

- පරිගණක භාවිතා කරන පුස්තකාලයේ වලංගු සාමාජිකයන් විසින් සිය කාඩ්පත භාවිතා කරගෙන පරිගණකය වෙත ලොග් ඉන් විය යුතුය. වික්ටෝරියා ප්‍රාන්තය වෙත පැමිණෙන අමුත්තන් විසින් හඳුනා ගැනීමේ ලියවිලි ලබා දුනහොත් පරිගණක භාවිතය සඳහා අමුත්තන් සඳහාවූ කාඩ්පතක් ලබාගත හැකිය.

- වයස අවුරුදු 16 ට වඩා අඩු භාවිතා කරන්නන් වෙනුවෙන් මාපියෙකු හෝ භාරකාරයෙකු ඇපකරු වශයෙන් ලියාපදිංචි විය යුතුය. සිය දරුවා ඉන්ටර්නෙට් භාවිතය සහ පුස්තකාලයේ ඇති තාක්‍ෂණ සම්පත් වෙත ප්‍රවේශවීම සම්බන්ධ සම්පූර්ණ වගකීම මාපියන් හෝ භාරකරුවන් විසින් භාරගත යුතුය.

- එක් අවස්ථාවකදී පුස්තකාල පරිගණකයක් දෙදෙනෙකුට වඩා වැඩි සංඛ්‍යාවක් විසින් භාවිතා කල නොහැක.

- ප්‍රවේශවීම, සම්ප්‍රේෂණය, ප්‍රදර්ශනය කිරීම, මුද්‍රණය කිරීම සහ දේවල් ගබඩා කිරීම ඇතුළු ඉන්ටර්නෙට් භාවිතය සම්බන්ධ සියළු කරුණු සඳහා තමා විසින් වෙන්කරගෙන ඇති කාලයේදී සම්පූර්ණ වගකීම භාරගත යුතුය.

- භාවිතා කරන අය විසින් සියළුම ප්‍රාන්ත, ෆෙඩරල් නීති සහ අංක 3 දරණ පළාත් නීතියට අනුකූලවීම අවශ්‍යවේ.

- ආක්‍රමණශීලී හෝ නීති විරෝධී ලෙස සලකනු ලබන දේ හිතාමතා බාගත කිරීම/ හෝ නැරඹීම ප්‍රකාශිතවම තහනම්ය. නොමනා ලෙස ඉන්ටර්නෙට් භාවිතා කිරීමට පහත දේ ඇතුලත් අතර ඒවාට පමණක් සීමා නොවේ:
  - උපකරණ, මෘදුකාංග හෝ පුස්තකාලයට අයත් දත්ත විනාශ කිරීම හෝ ඒවාට හානි පැමිණවීම.
  - සාමාන්‍යයෙන් ලිංගික වශයෙන් ප්‍රකට රූප ඇතුළු දේ නැරඹීම.
  - ප්‍රකාශන අයිතිය ඇති දේවල් හිතාමතා, බලය නැති අවස්ථාවල පිටපත් කිරීම හෝ බලපත්‍ර වැඩපිළිවෙලවල් සහ වෙනත් ගිවිසුම් උල්ලංඝනය කිරීම.
  - ඕනෑම පරිගණක ජාලයක ආරක්‍ෂක පද්ධති උල්ලංඝනය කිරීම හෝ උල්ලංඝනය කිරීමට තැත් කිරීම.
  - තොරතුරු මාර්ග නිර්මාණය කරන, කතෘ අයිතිය ඇති අය, භාවිතා කරන අය හෝ විෂය වන පුද්ගලයෙකුගේ හෝ ආස්ථිතියක පුද්ගලිකභාවය උල්ලංඝනය කිරීම.
  - බලය නොමැතිව, ඉලෙක්ට්‍රොනික සන්නිවේදන නියාමනය කිරීම.
  - ඊමේල් සේවා ස්පෑමිංග් ලෙස වැරදි විදිහට භාවිතය.
  - මොනෑෂ් නගර සභාවේ *වගකියන ආකාරයේ සූදු ක්‍රීඩා උපායමාර්ගයට* අනුකූල සූදු ක්‍රීඩා සහිත වෙබ් අඩවි.

- නිශ්චිත ක්‍රියාවලි, ලිපිගොනු ආකාර සහ බාගත කිරීමේ ප්‍රමාණ සීමා කිරීම සඳහා පුස්තකාලයට අයිතිය ඇත.

- පරිගණක භාවිතා කරන අය මුද්‍රණය කිරීමේ ගාස්තු ප්‍රකාරව සියළුම මුද්‍රණ වියදම් සම්බන්ධයෙන් වග කිව යුතුය.

- මෙම කොන්දේසිවලට අනුකූලවන ආකාරයට කටයුතු කිරීමට අසමත්වීම හේතුවෙන් පරිගණක සහ ඉන්ටර්නෙට් සම්බන්ධයෙන් ඇති වරප්‍රසාද අත්හිටුවීමට හේතුවේ.

- පුස්තකාල ඉන්ටර්නෙට් සම්පත් භාවිතය සම්බන්ධ නීති විරෝධී කියා හේතුවෙන් පළාත්, ප්‍රාන්ත හෝ ෆෙඩරල් අධිකාරීන් මගින් නඩු පැවරීමටද යටත්වේ.

- පුස්තකාල කාර්‍ය මණ්ඩලයේ අභිමතය අනුව සැසියක් අවසන් කිරීමට පුස්තකාලයට අයිතිය ඇත.

- සිය පරිගණක ඔස්සේ සම්ප්‍රේෂණය වන සියළුම දේ නියාමනය කිරීමට මොනෑෂ් නගර සභාවට අයිතිය ඇත.